## 1848 විමුක්ති අරගලය

ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය විරෝධී දෙවන නිදහස් සටන ලෙස ද හඳුන්වනු ලබන ක්‍රි.ව. 1848 සටන ප්‍රධාන වශයෙන් සිය ජීවනෝපාය කරගෙන යාමට නොහැකි තත්ත්වයට ඇද වැටුණු ගොවියන්ගේ දුක්ගැනවිලි ඉදිරිපත් කිරීමකි. එබැවින් මෙය ගොවියන්ගේ සටනක් ලෙසත් ගොවිජන ආන්දෝලනයක් ලෙසත් හඳුන්වනු ලැබේ.

බ්‍රිතාන්‍ය විරෝධී මෙම ව්‍යාපාරයට තුඩු දුන් ප්‍රධාන හේතු දෙකකි.

- කෝල්බෲක් - කැමරන් ප්‍රතිසංස්කරණවල ප්‍රතිඵල
- ටොරිංටන් සාමිවරයාගේ බදු ප්‍රතිසංස්කරණ

## කෝල්බෲක් ප්‍රතිසංස්කරණවල බලපෑම

කෝල්බෲක් කැමරන් කොමිසමේ නිර්දේශ පරිදි ක්‍රි.ව. 1833 දී ක්‍රියාත්මක කළ ප්‍රතිසංස්කරණ කිහිප ආකාරයකටම ක්‍රි.ව. 1848 විමුක්ති අරගලය කෙරෙහි බලපෑවේ ය.

01. එම ප්‍රතිසංස්කරණ යටතේ ඉඩම් විකිණීමේ ප්‍රතිපත්තියක් ආරම්භ කෙරිණි. ඒ අනුව රජයේ ඉඩම් නිශ්චය කර ගැනීම සඳහා ක්‍රි.ව. 1840 පනවන ලද මුඩු බිම් පනත යටතේ ගොවි ජනතාවට හිමි වීමට තිබූ උඩරට ඉඩම් විශාල ප්‍රමාණයක් රජයේ ඉඩම් බවට පත් කොට ගෙන විදේශීය ව්‍යාපාරිකයන්ට වතු වගාව සඳහා විකුණා දමනු ලැබී ය. එමගින් ගොවි ජනතාවගේ ප්‍රධාන ජීවනෝපායක් වූ හේන් ගොවිතැනට තිබූ ඉඩම් ඔවුන්ට අහිමි කෙරිණි.

02. ඈත අතීතයේ පටන් ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තය සඳහා රජයෙන් අනුග්‍රහය ලැබිණි. එහෙත් කෝල්බෲක් ප්‍රතිසංස්කරණ යටතේ ගොවි ජනතාව නොසලකා හැරුණ අතර රජයේ අනුග්‍රහය ලැබුණේ වතු වගාවට ය.

03. දේශීය සම්ප්‍රදාය අනුව ගොවියන් අතර ආරවුල් විසඳීම, ගම්වල වැව්, අමුණු, ඇළ, වේළි තැනීම හා අලුත්වැඩියා කිරීම ගම් සභාව මඟින් ඉතා සාර්ථක ලෙස සිදු කරන ලදී. ගොවියන් අතර ඇති වූ නඩු හබ විසඳන ලද්දේ ද ගම් සභාව මඟිනි. ක්‍රි.ව. 1833 ක්‍රියාත්මක කළ ප්‍රතිසංස්කරණ යටතේ ගම් සභාව සතුව පැවති එම බලතල සහ කාර්ය භාරයන් සියල්ල එයට අහිමි විය. එහි ප්‍රතිඵල වශයෙන් ග්‍රාමීය ජනතාවගේ ගොවිතැන් කටයුතු වලට සේවා සැලසීමේ වගකීම පැවරුණ කිසිවකු හෝ නොමැති විය.

04. කැමරන්ගේ අධිකරණ ප්‍රතිසංස්කරණ අනුව ගැමියන්ගේ සුළු ආරවුලකට පවා නගරයේ පැවති උසාවි කරා යාමට සිදුවිය. නීතිඥ ගාස්තු සහ මුද්දර ගාස්තු ගෙවීමට, මඟ වියදම් දැරීමට ආදි වශයෙන් විශාල මුදලක් වැය කරන්නට සිදු විය. කල්දමනු ලබන නඩු වාරයක් පාසා තම ගොවිපලෙන් බැහැරව දීර්ඝ කාලයක් උසාවි ගානේ කාලය ගත කිරීමට ගොවියාට සිදු විය. භාෂාව, සම්ප්‍රදාය හෝ දේශීය නීති රීති කිසිවක් නොදත් ඉංග්‍රීසි නඩුකාරයන් විසින් දෙන ලද තීන්දු

සාධාරණයයි ගැමියාට ඒත්තු ගියේ ද නැත. මෙම තත්ත්වය යටතේ ක්‍රි.ව. 1833 ප්‍රතිසංස්කරණ හේතු කොට ගැමි ජනතාවට මහත් දුෂ්කරතාවලට මුහුණ දීමට සිදු විය.

05. ක්‍රි.ව. 1833 ප්‍රතිසංස්කරණ යටතේ රාජකාරි ක්‍රමය අහෝසි කිරීම ද ජන ජීවිතය බිඳ වැටීමට හේතු විය. දේශීය ක්‍රමය යටතේ වැව්, අමුණු, ඇළ වේලි ඉදිකිරීම සහ නඩත්තු කිරීම සඳහා යොදා ගත්තේ අනිවාර්ය සේවා රාජකාරි ක්‍රමය යටතේ ලබා ගත් ශ්‍රමය යි. ගම් සභාව බෙලහීන කොට අනිවාර්ය සේවා රාජකාරි ක්‍රමය ද අවලංගු කිරීම නිසා ගම්වල කෘෂිකාර්මික කටයුතුවලට අවශ්‍ය වාරිමාර්ග සේවා සැපයීම සහ පොදු කටයුතු ඉටු කිරීමට භාර වූ කිසිවකු හෝ නැති තත්ත්වයක් උදා විය. එය ගැමි ජනතාව මහත් අසරණ තත්ත්වයට පත් කිරීමට හේතු විය.

**ශිෂ්‍ය ක්‍රියාකාරකම**

රටට ගැළපෙන පරිපාලන ආයතනයක් වශයෙන් පැවතුණ ගම් සභාව කෝල්බෲක් කැමරන් ප්‍රතිසංස්කරණ යටතේ බලරහිත වී ගිය අයුරු විමසන්න.

## ටොරිංටන් සාමිවරයාගේ බදු ප්‍රතිපත්තිය

ආණ්ඩුවේ ආදායම වැඩි කර ගැනීම සඳහා අලුතෙන් බදු කිහිපයක් පනවන්නට ටොරිංටන් ආණ්ඩුකාරයාට සිදු විය. බෝට්ටු, බරකරත්ත, තුවක්කු සඳහා පමණක් නොව, ගෙදර ඇති කරන බල්ලන් සඳහා ද බද්දක් පැනවී ය. නඩු හබ සඳහා වූ ලියකියවිලි වලට ගෙවන මුද්දර ගාස්තුව වැඩි කරන ලදී.

සෑම පිරිමියකුම අවුරුද්දකට නියමිත දින ගණනක් පාරවල් තැනීම හෝ ඒවා අලුත්වැඩියා කිරීම හෝ සඳහා නොමිලේ සේවය කළ යුතු විය. එසේ නැතහොත් ශ්‍රමය වෙනුවට නියමිත හිලව් මුදලක් ගෙවීමට සිදු විය. ඇඟ බද්ද නමින් හැඳින් වූ මේ බද්ද පැනවීම නැවත රාජකාරි ක්‍රමය ක්‍රියාත්මක කිරීමට තැත් කිරීමක් යැයි ගොවියෝ සැක කළහ.

මේ අතර ''නිල් පොත'' නමින් සංඛ්‍යා ලේඛන සංග්‍රහයක් සකස් කිරීම සඳහා ආණ්ඩුව විසින් සමීක්ෂණයක් කරන ලදී. "මේ තවත් බදු පැනවීමකට අර ඇඳීමකැ"යි ජනතාව සැක පහළ කළහ.

## සටනේ ආරම්භය සහ ව්‍යාප්තිය

තම දුක්ගැනවිලි ආණ්ඩුවට ඉදිරිපත් කොට සහනයක් ලබා ගැනීමට ජනතාව බලාපොරොත්තු වූහ. ක්‍රි. ව. 1847 ජුලි මාසයේ දී 4000 ක පමණ කණ්ඩායමක් ආණ්ඩුකාරයාට පෙත්සමක් භාරදීම සඳහා රැස් වූහ. ටොරිංටන් ආණ්ඩුකාරයා කෙළේ යුද හමුද මෙහෙයවා එම පිරිසට වෙඩි තැබීම යි. එසේ වුව ද එම උද්ඝෝෂණ පැතිර ගියේ ය.

ගොන්ගාලේගොඩ බණ්ඩා, පුරන් අප්පු, හගුරන්කෙත ඩිංගිරාල සහ කඩහපොළ ස්වාමීන් වහන්සේ මේ සටනෙහි පුරෝගාමීහු වූහ. එම නායකයන්ගේ ප්‍රධානත්වයෙන් ගොන්ගාලේගොඩ බණ්ඩා සිංහලේ රජු ලෙස දඹුල්ලේ විහාරයේ දී අභිෂේක ලැබී ය. පුරන් අප්පු රජුගේ සේනාධිපතිවරයා විය. කඩහපොළ ස්වාමීන් වහන්සේගේ උපදෙස් අනුව නව රජු සහ සේනාධිපතිවරයා විසින් දියත් කරන ලද ඉංග්‍රීසි විරෝධී සටන් දඹුල්ල, මාතලේ, කුරුණෑගල ආදි විශාල ප්‍රදේශයක ව්‍යාප්ත විය.

## අරගලය මර්දනය කිරීම

1818 නිදහස් අරගලයේ දී දේශීය ජනතාවගේ සටන් පරාජය කිරීමේදී මහත් අපහසුතාවන්ට පත් වීමෙන් පාඩමක් ඉගෙන ගෙන සිටි බ්‍රිතාන්‍ය පාලකයෝ ක්‍රි.ව. 1848 සටන ආරම්භයේදී ම එය විනාශ කර දැමීමට පියවර ගත් හ.

ටොරිංටන් සාමිවරයා යුද්ධ හමුදාව යොදවා දරුණු ලෙස සටන් පරාජය කළේ ය. කඩහපොළ හිමියන් වෙඩි තබා මරණයට පත් කෙරිණි. ගොන්ගාලේගොඩ බණ්ඩාට එරෙහිව නඩු අසා කස පහර දී රටින් පිටුවහල් කෙරිණි. පුරන් අප්පුට මරණීය දණ්ඩනය නියම විය. ඔහු මරණ මොහොතේ පවා ඉතා එඩිතරව ඉංග්‍රීසීන්ට විරුද්ධ ව කථා කළ අතර ඉංග්‍රීසීන් මෙරටින් පලවා හැරීම සඳහා ජනතාව එකමුතු වීමේ අවශ්‍යතාව අවධාරණය කෙළේ ය.

මේ අවස්ථාවේ දි ටොරිංටන් සාමිවරයා කටයුතු කළ ආකාරය බ්‍රිතාන්‍ය ආණ්ඩුවේ දෝෂ දර්ශනයට භාජනය විය. ඔහු ආපසු කැඳවනු ලැබිණි. ඔහු විසින් පැන වූ බදු ද අවලංගු කෙරිණි. ගොවි ජනතාව කෙරෙහි ඉංග්‍රීසි ආණ්ඩුවේ සැලකිල්ල ප්‍රමාණවත් නැති බව ඉංග්‍රීසී ආණ්ඩුවට පැහැදිලි විය. 19 වන සියවස ඉදිරි කාලයේ දී බ්‍රිතාන්‍ය පාලකයන් දේශීය ජනතාවට හිතකාමී යම් යම් ප්‍රතිපත්ති අනුගමනය කළ බව මෙහි පහත ඡේදවලින් ඔබට දක්නට ලැබෙනු ඇත. එසේ වුවද 1848 සටන පරාජය වීමේ ප්‍රතිඵලය වූයේ ඉංග්‍රීසීන්ගේ බලය මෙරට ස්ථාවර තත්ත්වයකට පත් වීමයි.

### ශිෂ්‍ය ක්‍රියාකාරකම්

- 1848 විමුක්ති අරගලයට තුඩුදුන් හේතු පැහැදිලි කෙරෙමින් පුවත්පතකට ලිපියක් සකස් කරන්න.
- 1848 විමුක්ති අරගලයේ නායකයන්ගේ චරිත අගය කරන නාට්‍යයක් සම්පාදනය කොට පංතියේ රඟ දක්වන්න.

## බ්‍රිතාන්‍යයන් යටතේ ආණ්ඩුක්‍රම විකාශනය

අපේ රටේ ආණ්ඩුක්‍රමය ක්‍රමික ව විකාශනය වූවකි. අතීතයේ පටන් මහනුවර රාජ්‍ය සමයේ අවසානය තෙක් ම මෙරට පැවතියේ දේශීය රාජාණ්ඩු ක්‍රමයකි. එහි සුළු වෙනස්කම් ඇති වුව ද සමස්තයක් ලෙස ගත් කල අපරදිග ජාතීන් පැමිණෙන තෙක් පුළුල් වෙනස්කම් සිදු නො වී ය.

මේ රටේ ආණ්ඩුක්‍රමයේ පුළුල් වෙනස්කම් ඇතිවූයේ ඉංග්‍රීසි පාලන අවධියේදී ය. එහෙයින් මෙහි දී ආණ්ඩුක්‍රම විකාශනය යටතේ සාකච්ඡා කෙරෙන්නේ ඉංග්‍රීසීන් මෙරට යටත් කර ගැනීමෙන් පසුව රට පාලනය කිරීම සම්බන්ධයෙන් සිදු කළ වෙනස්කම් ය.

ඒ අනුව අපි දැන් ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම විකාශනයේ ඉතිහාසය ඉගෙනීම ආරම්භ කරමු.

## ක්‍රි.ව. 1833 ට පෙර ඉංග්‍රීසීන් යටතේ පැවති ආණ්ඩුක්‍රමය

ක්‍රි.ව. 1796 දී ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශ ඉංග්‍රීසි පෙරදිග ඉන්දියා වෙළෙඳ සමාගම යටතට පත් වීමත් සමඟ ඒ ප්‍රදේශවල සමාගමට අවශ්‍ය ආකාරයේ පාලනයක් ගෙන යාමට විධි විධාන යෙදී ය. ක්‍රි.ව. 1798 එම ප්‍රදේශවල ඉංග්‍රීසීන්ට විරුද්ධ ව ඇති වූ උද්ඝෝෂණයත් සමඟ වෙළෙඳ සමාගම තනිව ගෙන ගිය පාලනය අවසන් කෙරිණි. එතැන් සිට වෙළෙඳ සමාගම හා ඉංග්‍රීසී ආණ්ඩුව හවුලේ ගෙන ගිය ද්විත්ව ආණ්ඩුක්‍රමය ආරම්භ විය. ක්‍රි.ව. 1802 දී මුහුදුබඩ ප්‍රදේශ මුළුමනින්ම බ්‍රිතාන්‍ය කිරීටයේ යටත් විජිතයක් බවට පත්වීමත් සමඟ පාලන කටයුතු පිළිබඳව ඉංග්‍රීසී සමාගමට තිබූ බලය සම්පූර්ණයෙන් ම අහෝසි විය.

බ්‍රිතාන්‍ය කිරීටයේ යටත් විජිතයක් වශයෙන් මුහුදුබඩ ප්‍රදේශවල ක්‍රියාත්මක කළ ආණ්ඩුක්‍රමය එකල බ්‍රිතාන්‍ය යටත් විජිත බොහොමයක පැවති ආණ්ඩුක්‍රමයට සමාන විය. ඒ අනුව ආණ්ඩුකාරයාට බ්‍රිතාන්‍ය ආණ්ඩුවේ නියෝජිතයා ලෙස අසීමිත බලතල හිමි විය. ඒ නිසා ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ මාලාවක් ක්‍රියාත්මක කළ ක්‍රි.ව. 1833 වර්ෂය දක්වා ආණ්ඩුකාරයාට ඒකාධිපති බලතල හිමි වූ ආණ්ඩුක්‍රමයක් මුහුදුබඩ ප්‍රදේශවල ක්‍රියාත්මක විය.

උඩරට ප්‍රධානීන්ගේ ද සහාය ඇතිව ක්‍රි.ව. 1815 දී ඉංග්‍රීසීන් විසින් බලය පිහිටුවා ගන්නා ලද උඩරට ප්‍රදේශවලට එකල මුහුදුබඩ ප්‍රදේශවල ක්‍රියාත්මක කෙරමින් පැවති පාලන ක්‍රමය හඳුන්වා දීම කළ නොහැකි විය. උඩරට රාජ්‍යය අත්පත් කොට ගැනීමට ඉංග්‍රීසීන්ට උඩරට රදල ප්‍රධානීන්ගේ ආධාර, උපකාර ලැබී තිබුණ බැවින් අනාගතයේදීත් නොවෙනස්ව එම සහාය ලබාගැනීමේ අරමුණ ඇතිව ක්‍රි.ව. 1815 ගිවිසුමෙන් ඉංග්‍රීසීහු උඩරට පැවති දේශීය ක්‍රමය දිගට ම පවත්වාගෙන යන බවට පොරොන්දු වූහ.


ඉංග්‍රීසි ආණ්ඩුවට විරුද්ධව ක්‍රි.ව. 1818 දී දියත් කළ පළමුවන නිදහස් සටන පරාජය කිරීමෙන් පසු ව වුව ද ඉංග්‍රීසිහු උඩරට ආණ්ඩුක්‍රමය පිළිබඳව වැඩි වෙනසක් සිදු නො කළහ.

## ක්‍රි. ව. 1833 කෝල්බෲක් - කැමරන් ප්‍රතිසංස්කරණ

බ්‍රිතාන්‍ය ආණ්ඩුවට ශ්‍රී ලංකාව යටත් විජිතයක් සේ පවත්වාගෙන යාම සඳහා කරන්නට සිදු වූ පරිපාලන හා ආරක්ෂක වියදම් බෙහෙවින් අධික විය. ඒවා පියවා ගැනීමට මෙරටින් ලැබුණ ආදායම ප්‍රමාණවත් නොවී ය.

ඒ නිසා ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම, පරිපාලන සහ අධිකරණ ක්‍රම ගැන සොයා බලා වඩා යෝග්‍ය ක්‍රමයක් යෝජනා කිරීම සඳහා ක්‍රි.ව. 1829 දී කොමිෂන් සභාවක් පත් කොට එවන ලදී. මෙම කොමිසමේ සාමාජිකයින් වූයේ විලියම් කෝල්බෲක් සහ චාල්ස් හේ කැමරන් යන දෙදෙනාය. ආණ්ඩුක්‍රමය හා පරිපාලනය ගැන සොයා බලා යෝජනා ඉදිරිපත් කිරීම කෝල්බෲක්ටත් අධිකරණය ගැන සොයා බලා යෝජනා ඉදිරිපත් කිරීම කැමරන්ටත් පැවරි ය. මෙම කොමිසමේ යෝජනාවලට අනුව ක්‍රි.ව. 1833 දී ක්‍රියාත්මක කළ ආණ්ඩුක්‍රමයේ වැදගත් අංග කිහිපයක් විය.

එතෙක් ආණ්ඩුකාරයා සතුව පැවති අසීමිත බලතල අඩු කිරීමේ අරමුණ ඇතුව, ඔහුට සහාය වීම සඳහා නව ආණ්ඩුක්‍රමයේ ප්‍රධාන අංග ලෙස ව්‍යවස්ථාදායක මණ්ඩලයක් සහ විධායක මණ්ඩලයක් පිහිටුවී ය. ව්‍යවස්ථාදායක මණ්ඩලය නිලලත් සාමාජිකයන් 09 දෙනෙකුගෙන් සහ නිල නොලත් 06 දෙනෙකුගෙන් සමන්විත විය. විධායක සභාව මුළුමනින් ම සමන්විත වූයේ නිලධාරීන්ගෙනි. ව්‍යවස්ථාදායක සභාවේ නිලනොලත් සාමාජිකයන් තෝරාගැනීමේ බලය ආණ්ඩුකාරවරයා වෙත පැවරිණි.




පසු කාලයේ දී එංගලන්තයේ වෙස්මිනිස්ටර් පාර්ලිමේන්තු ක්‍රමය මෙරටට හඳුන්වා දීමේ මුල් බීජය වුයේ මෙම ව්‍යවස්ථාදායක සභාවයි. ක්‍රි.ව. 1833 ආණ්ඩුක්‍රමය යටතේ නිලනොලත් සාමාජිකයන් ජනවර්ග අනුව තෝරා ගත් අතර එය මෙරට අනාගතය කෙරෙහි බෙහෙවින් අහිතකර ප්‍රතිඵල ඇතිකරවන්නක් විය.

ව්‍යවස්ථාදායක සභාවට පත් වූ නිලලත් නියෝජිතයෝ හැම විටම ආණ්ඩුකාරයාට පක්ෂපාතීව කටයුතු කළහ. නිලලත් පිරිස බහුතරය වීම නිසා නිලනොලත් අයට සභාවේ බලයක් නොවී ය. තම ඉල්ලීම් වලට බ්‍රිතාන්‍ය ආණ්ඩුව ඇහුම්කන් දෙන තත්ත්වයක්

ඇති කිරීමට නම් නිලනොලත් සංඛ්‍යාව වැඩිකර ගත යුතු බව ව්‍යවස්ථාදායක සභාවේ සිටි නිලනොලත් අයට වැඩිකල් නොගොස්ම වැටහිණි. ඒ අනුව ව්‍යවස්ථාදායක සභාවේ නිලනොලත් සාමාජිකයන්ගේ සංඛ්‍යාව වැඩිකොට ගැනීම සඳහා ඔවුහු උද්ඝෝෂණ ආරම්භ කළහ. එම උද්ඝෝෂණ වල ප්‍රතිඵලයක් වශයෙන් ක්‍රි.ව. 1889 දී ව්‍යවස්ථාදායක සභාවේ නිලනොලත් සංඛ්‍යාව 08 දක්වා වැඩි කරන ලදී. එසේ එකතු කරන ලද නියෝජිතයන් දෙදෙනා මුස්ලිම් ජනතාව වෙනුවෙන් එක් අයකු හා උඩරට සිංහලයන් වෙනුවෙන් එක් අයෙකු වශයෙන් ජනවර්ග අනුව නම් කෙරිණි.

19 වන ශත වර්ෂයේ අවසාන භාගය වන විට දේශපාලන උද්ඝෝෂණ කළ මධ්‍යම පංතියේ ස්වභාවය ද වෙනස් විය. එතෙක් මේ උද්ඝෝෂණ ගෙන යන ලද්දේ වතු වගාවේ නියැලුණු යුරෝපීය ජාතිකයන් විසිනි. 20 වන සියවස ආරම්භය වන විට ඉංග්‍රීසි උගත් ශ්‍රී ලාංකික මධ්‍යම පංතිය වර්ධනය වෙමින් පැවති අතර ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ සඳහා උද්ඝෝෂණ කිරීමට ඔවුහු ඉදිරිපත් වූහ. මෙම ලාංකිකයන් තර්කානුකූලව ඉදිරිපත් කළ ඉල්ලීම් නිසා ඔවුන්ගේ උද්ඝෝෂණ නොසලකා සිටීමට බ්‍රිතාන්‍ය ආණ්ඩුව ට නොහැකි විය. ඒ නිසා ක්‍රි.ව. 1910 දී ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයක් ක්‍රියාත්මක කරන ලදී.

## කෲව්-මැකලම් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ (1910-1912)

ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ ඉල්ලා උද්ඝෝෂණ කළ ඉංග්‍රීසි උගත් මධ්‍යම පංතිකයන් අතර ජේම්ස් පීරිස්, පොන්නම්බලම් රාමනාදන්, ඊ.ජේ සමරවික්‍රම, එෆ්.ජේ ද මැල් ආදී හු ප්‍රමුඛත්වය දැරූහ. ඔවුන් විසින් ඉදිරිපත් කරන ලද සන්දේශ මගින් ඉල්ලීම් කිහිපයක් ඉදිරිපත් කොට තිබිණි.



රූපය 1.5
මැකලම් ආණ්ඩුකාරයා


01. ව්‍යවස්ථාදායක මණ්ඩලයට සාමාජිකයන් පත් කිරීමේ දී ජනවාර්ගික නියෝජනය අවලංගු කොට පළාත් බද නියෝජන ක්‍රමයක් හඳුන්වා දීම,

02. එම සාමාජිකයන් ආණ්ඩුකාරයා නම් කරනු වෙනුවට සීමිත ජනතා ඡන්දයෙන් තෝරා පත් කර ගැනීම,

03. ව්‍යවස්ථාදායක මණ්ඩලයේ බලතල පුළුල් කිරීම,

04. විධායක සභාවට ද නිලනොලත් සාමාජිකයන් පත් කිරීම යනාදිය 1909 දී සන්දේශකරුවන් ඉදිරිපත් කළ ප්‍රධාන ඉල්ලීම් කිහිපයකි.

මෙම ඉල්ලීම් සියල්ලට ම පාහේ මැකලම් ආණ්ඩුකාරයා විරුද්ධ විය. එහෙත් නැඟී එන ඉංග්‍රීසි උගත් මධ්‍යම පංතිය නොසලකා හැරිය නොහැකි බලවේගයක් බව ද ඔහු පිළිගෙන ඇත. සන්දේශකරුවන්ගේ ඉල්ලීම් සහ ආණ්ඩුකාරයා ඉදිරිපත් කොට තිබූ අදහස් සැලකිල්ලට ගෙන ක්‍රි.ව. 1910 දී යටත් විජිත භාර රාජ්‍ය ලේකම් කෲව් සාමිවරයා විසින් එංගලන්ත පාර්ලිමේන්තුවේ දී ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ සම්මත කරවා ගනු ලැබී ය. ප්‍රථම වරට ක්‍රි.ව. 1912 දී ක්‍රියාත්මක කළ එම සංශෝධිත ආණ්ඩුක්‍රමයේ සැලැස්ම පහත දැක්වෙන පරිදි විය.




**1910 කෲව්-මැකලම් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයේ කැපී පෙනෙන ලක්ෂණ කිහිපයකි.**

- ★ මෙරට ආණ්ඩුක්‍රම වර්ධන ඉතිහාසයේ ප්‍රථම වරට ව්‍යවස්ථාදායක මණ්ඩලයේ සාමාජිකයන් ඡන්ද බලයෙන් තෝරා ගැනීමේ මූලධර්මය හඳුන්වා දෙන ලදී.
- ★ ජනවාර්ගික නියෝජන ක්‍රමය තවදුරටත් ක්‍රියාත්මක කෙරිණි.
- ★ උගත් ශ්‍රී ලාංකිකයන් වෙනුවෙන් එක් නියෝජිතයකු ලබා දී ඇත. එය අනාගතයේ දේශීය ජනතාවට පුළුල් බලතල ලබා දීමට බලාපොරොත්තු වන බවට ඉඟියක් බඳු විය.
- ★ තව දුරටත් ව්‍යවස්ථාදායක මණ්ඩලයේ බහුතරය නිලලත් අය විය.
- ★ ව්‍යවස්ථාදායක මණ්ඩලයේ බලතල පුළුල් කෙරිණි.
- ★ විධායක මණ්ඩලය තව දුරටත් නිලලත් සාමාජිකයන්ගෙන් පමණක් සමන්විත විය.

මෙම ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයෙන් ජනතාවට වගකියන ආණ්ඩුක්‍රමයක් නොලැබුණත් නිදහස කරා යන ගමනේ නව පියවරක් ඉදිරියට තැබීමට අවස්ථාව ලැබිණි. එක් අතකින් මහජන ඡන්දය සීමිත වශයෙන් හෝ පාවිච්චි කොට ව්‍යවස්ථාදායක සභාවට නියෝජිතයන් පත්කිරීමට අවස්ථාව ලැබීම ද වැදගත් කරුණකි.

## මැනිං ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ (1920)

කෲව් - මැකලම් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ මඟින් ලබා දුන් නාමමාත්‍රික බලය ගැන ශ්‍රී ලාංකිකයෝ සතුටට පත් නො වූහ. ඒ නිසා ක්‍රි.ව. 1919 දී ජාතික සංගමය පිහිටුවාගෙන විධිමත් පරිදි ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ සඳහා උද්ඝෝෂණ කෙරිණි. ඊට ප්‍රතිචාර වශයෙන් ක්‍රි.ව. 1920 දී නැවත වරක් ව්‍යවස්ථාදායක සභාවේ සංශෝධනයක් සිදු කරනු ලැබී ය. ඒ අනුව එහි මුළු නියෝජිත සංඛ්‍යාව 37 දක්වා වැඩිකරන ලදී. ඔවුන්ගෙන් 14 දෙනෙක් නිලලත් අය වූ අතර 23 ක් නිල නොලත් අය වූහ. එයින් 16 දෙනෙක් සීමිත ඡන්දයෙන් ද ඉතිරිය ජාතීන් අනුව ආණ්ඩුකාරයා විසින් නම් කිරීමෙන් ද තෝරා ගන්නා ලදහ. මෙවර ඡන්ද බලය ක්‍රි.ව. 1910 දීට වඩා ස්වල්පයක් පුළුල් විය. එහෙත් ඡන්ද බලය ලැබුණේ ජනගහනයෙන් ඉතා සුළු කොටසකට පමණි.

**මැනිං ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ 1920 ව්‍යවස්ථාදායක සභාව**

- සාමාජිකයන් 37
  - නිලලත් 14
    - නිලබලයෙන් 5
    - ආණ්ඩුකාරයා නම් කළ නිලධාරීන් 9
  - නිලනොලත් 23
    - ඡන්ද බලයෙන් 16
      - ජනවර්ග හා වෘත්තීන් අනුව 5
        - යුරෝපීය 2
        - බර්ගර් 1
        - වෙළෙඳ මණ්ඩලය 1
        - පහත රට නිෂ්පාදකයන්ගේ සංගමය 1
      - පළාත්බද ඡන්ද කොට්ඨාස වලින් 11
        - කොළඹ - 1
        - බස්නාහිර පළාතට - 2
        - සෙසු පළාත්වලට 1 බැගින් - 8
    - නම් කිරීමෙන් 7
      - උඩරට සිංහල 2
      - මුස්ලිම් 1
      - ඉන්දීය දෙමළ 1
      - විශේෂ 3

### මැනිං ආණ්ඩුක්‍රමයේ විශේෂ ලක්ෂණ

- ව්‍යවස්ථාදායක සභාවේ ඉතිහාසයේ ප්‍රථම වරට නිලනොලත් නියෝජිතයන් බහුතරයක් පත් කිරීමට විධි විධාන යොදා ඇත.
- එසේ වුව ද නිලලත් සාමාජිකයන් 14 දෙනා සහ නම් කිරීමෙන් පත් කරන සාමාජිකයන් 7 දෙනා ආණ්ඩුකාරයාට පක්ෂව සිටීමට ඉඩ තිබිණි. එබැවින් තව දුරටත් ආණ්ඩුකාරයාට පක්ෂපාතී බහුතරයක් පවත්වාගත හැකි විය.
- පළාත්බද ඡන්ද කොට්ඨාස ක්‍රමය හඳුන්වා දීම අතිශය වැදගත් ලක්ෂණයකි.
- 1910 ප්‍රතිසංස්කරණයට වඩා 1920 දී ඡන්ද බලය පුළුල් කෙරිණි. උගත්කම, ධනවත් කම, වැනි සුදුසුකම් මත ඡන්ද බලය ලබා දුන් බැවින් ඡන්ද බලය ලැබුණේ 4%වැනි ප්‍රමාණයකට පමණි.
- ජනවාර්ගික නියෝජනය ද දිගට ම ක්‍රියාත්මක විය.
- නියමිත සුදුසුකම් සපුරා තිබුණේ වුව ද ස්ත්‍රීන්ට ඡන්ද බලය නොලැබිණි.
- ව්‍යවස්ථාදායක මණ්ඩලයේ බලතල පුළුල් කෙරිණි.
- රාජ්‍ය පාලන කටයුතු පිළිබඳ වගකීම තව දුරටත් පැවරී තිබුණේ ආණ්ඩුකාරයා වෙතට යි.

මෙම ප්‍රතිසංස්කරණයෙන් ද ආණ්ඩුකාරයාගේ බලතල අඩු වූයේ නැත. නිෂේධ බලතල රාශියක් ඔහු සතුව තිබුණි. එනිසා සංශෝධන ඉල්ලා සිටි නායකයෝ මෙම ආණ්ඩු ක්‍රමයෙන් සතුටට පත් නො වූහ. මේ වන විට ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ ඉල්ලා සිටි අයගේ සංවිධානය වූ ලංකා ජාතික සංගමය වෙනුවෙන් ශ්‍රීමත් ජේම්ස් පීරිස් මැනිං ආණ්ඩුකාරයා වෙත තම ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ යෝජනා ඉදිරිපත් කෙළේ ය.

### ශිෂ්‍ය ක්‍රියාකාරකම

1920 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සැලැස්ම නිරීක්ෂණය කොට ඔබට හඳුනාගත හැකි විශේෂ ලක්ෂණ පෙළගස්වන්න.